# ජීවිතය හා බැඳුණු ඵලදායිතා සංකල්ප

කැලණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ කථිකාචාර්ය

**එ.එම්. නිශාන්ති හේමකුමාරි**

අද්‍යතනයේ ලොව සෑම රටක්ම විශේෂ අවධානයක් හා උනන්දුවක් දක්වන ඵලදායිතා සංකල්පයට දිගු ඉතිහාසයක් තිබේ. මූලික වශයෙන් ඵලදායිතාව යනු වැරදි දේ නිවැරැදිව කිරීම වශයෙන් අර්ථ ගැන්විය හැකිය. ඵලදායිතා සංකල්පයේ පසුබිම පිළිබඳ විමසීමේදී ඒ පිළිබඳ ප්‍රංස ජාතික ලේඛකයන් හා චින්තකයන් කණ්ඩායක් වන හිසියොක්‍රටිස් වරුන් මේ පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කර තිබේ. (ක්‍රි. ව. 1700 දී පමණ) "අතිරික්තයක් උපදවන එකම ආර්ථික කටයුත්ත කෘෂි කර්මාන්තය වන අතර වඩා ඵලදායි ශ්‍රමය එහි යෙදවූ ශ්‍රමය බවත් දක්වයි."

එමෙන් ම නූතන අර්ථ ශාස්ත්‍රයේ පියා වන බ්‍රිතාන්‍ය ජාතික ඇඩම්ස්මිත් (ක්‍රි. ව. 1723 - ක්‍රි. ව. 1790) අදහස් කරනුයේ ශ්‍රම විභජනය හා විශේෂීකරණය මගින් ශ්‍රමයේ ඵලදායිතාව වැඩි වන බවත් වැඩ විශේෂීකරණය මගින් විශාල තාක්ෂණික පුහුණුවක් ඇතිවන බවත් ය. එමෙන් ම ඉන් නිෂ්පාදන වියදම් අඩු වී භාණ්ඩ මිල ද අඩුවේය යන්න ය.

ප්‍රගුණ කළ ශ්‍රම භාවිතය මගින් ශ්‍රම ඵලදායිතාව වර්ධනය වන අතර මිනිසුන් සමාජයේ ඵලදායි බලවේග බවට පත්වන බව විද්‍යාත්මක සමාජවාදයේ පියා වන ජර්මන් ජාතික කාල් මාක්ස්ගේ අදහස වේ. නූතන කළමනාකරණයේ පියා වන ඇමෙරිකා ජාතික ෆෙඩ්රික් ටේලර් (ක්‍රි. ව. 1856 සිට ක්‍රි. ව. 1915) ඵලදායිතා සංකල්පය ගැන අදහස් දැක්වූයේ යෙදවුම් හා නිමැවුම් අතර ඇති සබඳතාව සැලකිල්ලට ගනිමිනි. ඵලදායිතාව පිළිබඳ ඔහුගේ අදහස වන්නේ කාර්යක්ෂමතාව ඇගයීමට ලක්කිරීම අකර්යක්ෂමතාව සහ අපතය (නාස්තිය) නොඉවසීම එමෙන්ම නියැදියකින් වැඩ අධ්‍යයනය කර සාධාරණ වැටුප් ගෙවීම, ශ්‍රමිකයාගේ අනවශ්‍ය චලනය අවම කිරීම, වැඩ ක්‍රමවත්ව කිරීමෙන් ඵලදායිතාව වැඩිදියුණු කළ හැකි බව ය. එමෙන්ම, වැඩි නිපැයුම්වලට වැඩි වැටුප් ගෙවීම, නිෂ්පාදන අතිරික්තය වැඩි වන විට සේව්‍ය - සේවක දෙපාර්ශවයට ම ඉන් ප්‍රතිලාභ සහ දෙපාර්ශවයේ ම සහයෝගිතාව අවශ්‍ය බැව් ඵලදායිතාව සම්බන්ධයෙන් ඔහුගේ අදහස වේ.

## ජාතික ඵලදායිතා මධ්‍යස්ථාන

මේ අදහස් සැලකිල්ලට ගනිමින් අද්‍යතනයේ බොහෝ රටවල් ඵලදායිතා සංකල්පය කෙරෙහි අවධානය යොමු කර තිබේ. දෙවන ලෝක සංග්‍රාමයෙන් විනාශ වී ගිය රටවල නැවත කර්මාන්තශාලා සංවර්ධනයටත්, ආර්ථික උන්නතිය සඳහාත් අන්තර්ජාතික කම්කරු සංවිධානය හරහා ප්‍රබෝධයට පත් වූ ඵලදායිතා සංකල්ප ඉවහල් වූ අතර ඒ සඳහා ජාතික ඵලදායිතා මධ්‍යස්ථාන ද ඇති විය.

ක්‍රි. ව. 1955 දී ජපාන ඵලදායිතා මධ්‍යස්ථානයත් ක්‍රි. ව. 1961 දී ආසියානු ඵලදායිතා සංවිධානයත් බිහි වූ අතර ක්‍රි. ව. 1996 වසරේ දී ශ්‍රී ලංකාවට ද



එහි සාමාජිකත්වය ලැබිණි. එහෙයින් 96 වසර "ජාතික ඵලදායිතා වර්ෂය" ලෙසත් 1997-2007 දක්වා කාලය ඵලදායිතා දශකය ලෙසත් නම් කර තිබේ. මුළු විශ්වයම එකම ගම්මානයක් තරමට කැටිකිරීමට සමත් තාක්ෂණික ජයග්‍රහණ අභිමුවේ ඵලදායිතා සංකල්ප සහ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමෙන් එම ජයග්‍රහණය විජයග්‍රහණය කළ හැකි ය.

## ඵලදායිතා සංකල්ප

මූලික වශයෙන් මෙය කොටස් 5 කට බෙදා දැක්විය හැකි ය.

1. භෞතික ඵලදායිතාව
2. ආකල්පමය ඵලදායිතාව
3. සමාජමය ඵලදායිතාව
4. එකතු කළ අගය නම් සංකල්පය
5. හරිත ඵලදායිතාව

### 1. භෞතික ඵලදායිතාව

නිෂ්පාදනය සහ එයට යෙදවූ සම්පත් අතර අනුපාත නොහොත් නිපැයුම් සහ යෙදවුම් අතර සබඳතාව භෞතික ඵලදායිතාව වේ.

### නිපැයුම්

| භාණ්ඩ | සේවා |
|---|---|
| පාරිභෝගික භාණ්ඩ | අධ්‍යාපනය හා පුහුණුව |
| ප්‍රාග්ධන භාණ්ඩ | ප්‍රවාහනය |
| | රක්ෂණය |
| | රාජ්‍ය සේවය, වෛද්‍ය, බැංකු ආදී සේවාවන් |
| | විකිණීම හා අලෙවිය |
| | විදුලිය |
| | ජල සැපයුම |
| | ප්‍රචාරණය |

යෙදවූ සම්පත්වලට වඩා වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් ඇති කොට ඒවායේ ප්‍රමිතිය ද වර්ධනය කිරීමෙන් වැඩි ඵලදායිතාවක් ඇති වේ.

යෙදවුම් (සම්පත්) මිනිස් බලය, බලසම්පත්, ද්‍රව්‍ය වශයෙන් බෙදා දැක්විය හැකි ය. මිනිස් බලය යනුවෙන් දැක්වූයේ ප්‍රාග්ධනය යි. එයට නිර්මාණශීලීත්වය, අත්දැකීම්, ආකල්ප, අභිප්‍රේරණය, ස්ත්‍රී - පුරුෂ භාවය, සමාජ භාවය, අධ්‍යාපනය ආදිය අයත් වේ. ද්‍රව්‍ය යන්නට ස්වභාවික, කාර්මික, භෞතික යෙදවුම් අයත් වේ. එමෙන්ම බලසම්පත් යටතේ ඉන්ධන, ඛනිජ තෙල්, මූල්‍ය සම්පත්, කම්හල්, යන්ත්‍ර සූත්‍ර තොග, ඉතිරිකිරීම්, ව්‍යාපාර කොටස් යනාදිය අයත් වේ.

* විග්‍රහයේ පහසුව තකා ඵලදායිතාව වැඩි කරන ක්‍රමයන් මෙසේ දැක්විය හැකි ය.
* යෙදවුම් ප්‍රමාණය අඩුකොට නිෂ්පාදන එකම මට්ටමකින් පවත්වාගෙන යාම
* යෙදවුම් ඒ මට්ටමින් ම පවත්වා නිපැයුම් වැඩි කිරීම
* යෙදවුම් වැඩි ප්‍රමාණයක් අඩු කොට නිපැයුම් අඩු ප්‍රමාණයකින් අඩු කිරීම
* යෙදවුම් අඩුකොට නිපැයුම් ප්‍රමාණය වැඩි කිරීම
* යෙදවුම් අඩු ප්‍රමාණයකින් වැඩි කොට නිපැයුම් වැඩි ප්‍රමාණයකින් වැඩි කිරීම

ඵලදායිතාව වැඩිකිරීම සඳහා සඵලමත්භාවයත් කාර්යක්ෂම බවත් මනා ලෙස සංකලනය විය යුතු වේ.

මෙහිදී 'සඵලමත්භාවය' යනුවෙන් අදහස් කරන්නේ සංවිධානයේ අරමුණ හා ඉලක්ක සපුරා ගැනීම සඳහා කළ යුතු දේ නිරවද්‍යව තෝරා බේරා ගැනීම වේ.

කාර්යක්ෂමතාව යනුවෙන් අදහස් කරනුයේ නිවැරැදි දේ නිවැරැදිව කිරීම යි. එනම් අපතේ යාමකින් තොරව වැඩිම ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය විකල්ප තෝරා බේරාගෙන සම්පත් භාවිත කිරීම වේ.

මේ කාර්යක්ෂම බව සහ සඵලමත්බව කේන්ද්‍ර කරගත් ඵලදායිතාව අර්ථ ගැන්වීම සඳහා ජපන් ජාතිකයන් කදිම අදහසක් ඉදිරිපත් කර තිබේ. එනම් මේ භෞතික ඵලදායිතාවයෙන් තොරවීම මඟින් කර්මාන්තශාලාව තුළදී හෝ සාමාන්‍ය ජීවිතයේ දී තමා පාප කරගන්නා බවයි.

| | |
|---|---|
| 1. වැඩිපුර නිපදවීම | 2. බලා සිටීම |
| 3. අනවශ්‍ය තොග | 4. අනවශ්‍ය ප්‍රවාහනය |
| 5. අනවශ්‍ය චලනය | 6. දෝෂ සහිතව නිපදවීම |

7. වැඩිපුර සැකැසීම නැත්නම් මිශ්‍ර කිරීම එම පාප වේ.

### 2. ආකල්පමය ඵලදායිතාව

ඵලදායිතාව මිනිස් සිත තුළ ඇතිවන ආකල්පයක් වන අතර එය වැඩි දියුණු වීමට නම් ධනාත්මක පුරුදු ඇතිකර භාවිතයේ යෙදවීම කළ යුතු වේ. මනා කළමනාකරණයෙන් ශ්‍රම සම්පතෙහි ගුණාත්මක බව වැඩිදියුණු කර අදට වඩා හෙට දිනය සවිමත් කර ගැනීම සඳහා යහපත් සේවක අභිප්‍රේරණයක් කළ යුතු වේ.

### 3. සමාජමය ඵලදායිතාව

ඵලදායිතාව යනුජාතික සුභසාධනය නොහොත් නිරන්තර ප්‍රගතිය සහ උසස් ජීවන තත්ත්වයක් පැවැතීමයි. එනම් එමඟින් වැඩි ආයෝජන, රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, සේවකයාට වැඩි වැටුප්, රැකියා තෘප්තියෙන් ඇතිවන උනන්දුව හා රැකියා සුරක්ෂිතභාවය ඇති කරයි. සමාජමය ඵලදායිතාව මඟින් ඇති කරන ප්‍රයෝජන අතර

* භාණ්ඩවල මිල අඩුවීම
* උසස් තත්ත්වයේ භාණ්ඩ සුලභවීම
* විශාල භාණ්ඩ ප්‍රමාණයක් තරගකාරී මිලකට දිය හැකිවීම
* භාණ්ඩවලට ඉල්ලුම වැඩිවීම
* පාරිභෝගිකයා තෘප්තිමත් වීම සහ ඔහුට උසස් තත්ත්වයේ නිෂ්පාදන ලබා ගැනීමට ඇති හැකියාව
* ජීවිතය අර්ථවත්ව විවේකීව ගත කිරීමට ඇති හැකියාව සහ වැඩි විශ්‍රාමික වැටුප් හිමිවීම

මේ කරුණු භෞතික වශයෙන් සහ අභෞතික වශයෙන් මානසික සන්තෘෂ්ටිය ලබා දෙන්නා වූ ඵලදායිතාවයේ ඵලය වන අතර අතුරු ඵල වශයෙන් ද යහපත් වූ ක්‍රියා පද්ධතියක් සමාජයට දායාද කැරේ.

යහපත් වූ ක්‍රියාශීලී සේවක පිරිසක් මඟින් විනයගරුක සමාජයක පුද්ගල භූමිකාව නිරූපණය කිරීම වේ. ඵලදායිතාව යනු මානව උත්සාහය වන අතර එය නිපැයුම, තෘප්තිය, යෙදවුම, කැපවීම යන අංග තුළ අන්‍යෝන්‍ය බැඳීම මත රඳා පවතී.

### 4. එකතු කළ අගය නම් සංකල්පය

මුළු විකුණුම් - මිලටගත් ද්‍රව්‍ය හා සේවා = එකතු කළ අගය

එකතු කළ අගය - වැටුප් + ලාභාංශ + ලාභ + බදු + කුලී + පොලී + අය බදු + ක්ෂය කිරීම්

මේ සංකල්පය යටතේ ගැනෙන්නේ ඵලදායිතාව යනු සියලුම භාණ්ඩ හා සේවාවන් (යෙදවුම්) නිෂ්පාදිත වූ (අලෙවි කළ) ප්‍රමාණයෙන් අඩු කිරීමේදී ඉතිරිවන ප්‍රමාණය එකතු කළ අගය නොහොත් මිනිස් උත්සාහය සහ දැනුම වේ.

එමෙන්ම පාරිභෝගිකයා ගෙවන මිල හා නිෂ්පාදන අමුද්‍රව්‍ය සහ සේවා වලට ගෙවන මිල අතර වෙනස වශයෙන් ද එකතු කළ අගය යන්නට අර්ථ කතන දිය හැකි ය.

### 5. හරිත ඵලදායිතාව

කාර්මික සංවර්ධනය හේතුවෙන් විවිධ පාරිසරික ගැටලු පැන නැගීම සිදු වේ. මේ තත්ත්වය වැළැක්වීම හරිත ඵලදායිතාව වේ. යථාර්ථවාදී ආර්ථික සංවර්ධනය සඳහා පරිසරය නිසියාකාරව කළමනාකරණය කළ යුතු වේ. ආසියාතික ඵලදායිතා සංවිධානයට අයත් 1996 දී පිහිටුවාගත් ලෝක හරිත ඵලදායිතා සමුළුවේ මැනිලා ප්‍රකාශනයේ අඩු සම්පත් භාවිත කිරීම වැනි ඵලදායිතා ඉලක්ක කරගත් නිෂ්පාදනය සහ හරිත ඵලදායිතාව ගැන සඳහන් වේ. හරිතඵලදායිතාව, පාරිසරික සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය අතර ඒකාබද්ධතාවක් ඇතිකරන බලවේගය වන අතර පරිසරය නොතකා හැර ඵලදායිතාව තංවාලිය නොහේ.

**ඵලදායිතාව අර්ථ ගැන්වීම සඳහා අප විසින් කළයුතු ක්‍රියාමාර්ග අතර නාස්තිය අවම කිරීම යන කරුණටත් විශේෂත්වයක් හිමි වේ.**

අමුද්‍රව්‍ය, ශ්‍රමය, බලශක්තිය, මූල්‍ය සම්පත් යන මේවායේ නාස්තිය අපතේ යාම නතර කිරීමෙන් ඵලදායිතා සංකල්පය අර්ථ ගැන්වේ.

*** අමු ද්‍රව්‍ය**

භාණ්ඩ හා සේවා සඳහා නිෂ්පාදනයේ දී යොදා ගන්නා අමුද්‍රව්‍ය වලින් උපරිම ඵල නෙළාගත යුතුය. අමුද්‍රව්‍යවල අක්‍රමික වූ භාවිතයෙන් නාස්ති වීම සිදු වේ.

උදා : වශයෙන් අප දිවා ආහාරයට ගන්නා බත් පැකට්ටුව ගතහොත් අප ඉන් ප්‍රයෝජනයට ගන්නේ බොහෝ කොට 80% කි. එහෙත් මූලික වශයෙන් අප මේ කරුණ ගැන දැනුවත් නොවුනහොත් අප එදිනෙදා භාවිතයේදී කොතෙක් ආහාර නාස්ති කර තිබේදැයි සිතීම වැදගත් වේ.

මේ ආකාරයටම කර්මාන්ත ශාලාවක් ගතහොත් 20% ක් පමණ වන නාස්ති කිරීම් 4% දක්වා අවම කර ගැනීමෙන් ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ය.

**ශ්‍රමය**

ශ්‍රමයෙන් උපරිමාකාරයෙන් ප්‍රයෝජන ගත යුතු නම් එම ශ්‍රමය සඵලවත්ව හා කාර්යක්ෂම ලෙස යොදා ගත යුතු ය. උදා : පවුලක් ගත හොත් එහි දෙදෙනෙකු මහන්සි වී වැඩ කරයි නම් අන් දෙදෙනා මල් පැලයකට සාත්තු කිරීම් වැනි දෙයක්වත් නොකර ඉතා අලසව සිටී නම් එතන සිදුවනුයේ ශ්‍රම නාස්තියකි. ඔවුන් සියල්ලම එක ආකාරයට හැකි පමණ මහන්සි වී කටයුතු කරයි නම් එම පවුලේ ආර්ථිකයත් ශ්‍රමයත් ඵලදායක වේ.

ජපානය වැනි රටක පෙර පාසල් දරුවා පවා මේ ඵලදායිතාව සඳහා දායක වේ. ඔහු තමාගේ ලියන මේසය පිරිසුදු කිරීම, තම බෑගය සකස්කර ගැනීම, පෙරපාසල වෙත නිතිවම ගමන් කිරීම ආදිය ඔහුට සැහෙන ආකාරයෙන් ඵලදායි ක්‍රියා පද්ධතියකට හවුල් වේ.



එසේම අප රටේ බොහෝ කර්මාන්තවල ද ශ්‍රමය අපතේ යාම සිදුවන අතර එය සඵලවත්ව හා කාර්යක්ෂමව භාවිතයට ගත යුතු ය. ඒ සඳහා

* සේවකයන්ට නිෂ්චිත කාර්යයන් පැවරීම
* නිර්මාණශීලීව කටයුතු කිරීමට පෙළඹවීම
* මනා දැනුවත් කිරීම
* කාර්යසාධනය

ආදිය කිරීම මගින් ශ්‍රම නාස්තිය අවම කර ඉන් ඵලදායිතා සංවර්ධනය කරා ළඟා විය හැකිය.

**බලශක්තිය**

බොහෝවිට නොදන්නාකම නිසා සහ නොසැලකිල්ල නිසා බලශක්තිය අපතේ යාම සිදු වේ. නිවසක් ගතහොත් එහි භාවිත කරන විදුලි උපකරණ කිසිම ප්‍රයෝජනයක් නොමැතිව ක්‍රියාත්මකව තිබේ. උද : විදුලි බල්බ උදාහරණයකොට ගතහොත් අවශ්‍ය නැතිවිටදී එමෙන්ම එයින් ආලෝකය ලැබීමට කිසිවෙකු නොමැති විටදී පවා දල්වා තිබේ. එමෙන්ම කාමර කිහිපයක විදුලි බුබුලු දල්වා වැඩ කටයුතු කිරීම නොකොට හැකිනාක් දුරට සියල්ල ම එකම තැනක සිට එක විදුලි බල්බයක් ආධාර කරගෙන එම කාර්යයන්හි නියැලීම අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම ආදිය කිරීම, එකම කාර්ය සඳහා කිහිපවිටක් විදුලි උපකරණ ක්‍රියාත්මක නොකොට එකම විටක දී එම ප්‍රයෝජන ගැනීමට උත්සුක වීම ආදිය මගින් විදුලි පරිභෝජනය අවම කර ඵලදායී බලශක්ති මෙහෙයුමකට අඩිතාලම දැමිය හැකි ය. කර්මාන්ත ශාලාවක් තුළදී වුවද මනා සේවක දැනුවත් කිරීම් මත මේ කාර්යයන් දියත් කළ හැකි ය. විවේකව සිටින සෑම විටම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාවිරහිත කරමින් ආදී බලශක්ති පිරිසුම් ක්‍රියා මගින් වැයවන මුදල් ප්‍රමාණය ඉතිරි කර ගත හැකි බවත් එමගින් සේව්‍ය - සේවක දෙපක්ෂයේ ම වැටුප් වැඩිවීම ආදී ඵලදායිතා ව්‍යාපාර ක්‍රියාත්මක වීමට රුකුල් ලැබෙන බවත් ඒත්තු ගන්වා ඔවුනොවුන් දැනුවත් කළ යුතු වේ. මෙසේ දර, භූමිතෙල්, පෙට්‍රල් ඈදී සියලු බලශක්ති නාස්තිවීමද උපක්‍රමශීලීව හා සංවිධානාත්මකව අවම කර ගැනීම තුළින් ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ය.

**-මූල්‍ය සම්පත්**

මුදල් ආයෝජනය කිරීමේදී මූල්‍ය සම්පත් නාස්තිවීම අවම කිරීම මගින් ඵලදායිතා වර්ධනය සිදුකර ගත හැකි ය. උද: පුද්ගලයකු මාසයක් තුරා හරිහම්බ කර ගත් මුදල් (වැටුප්) එක් දිනකදී (ශීඝ්‍රයෙන්) විනාශ කර (නාස්ති කර) දමනවා නම් ඔහු ඵලදායක නොවේ. ඒවා වියදම් කිරීමට පළමු එම භාණ්ඩය තමාට සැබවින් ම ප්‍රයෝජනවත් වන දෙයක් ද යන්න කිහිප සැරයක් සිතිය යුතු ය. භාණ්ඩ හා සේවාවන් උපරිම ප්‍රයෝජනය සහ ප්‍රමුඛතාවයන්ට අනුව මිලදී ගත යුතු වේ. කර්මාන්තශාලාවකදී වුවද එසේ ම ය. කර්මාන්තයක් අරඹා පවත්වා ගෙන යාමේදී අවැසි සම්පත් සහ පහසුකම් සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර එම පිරිවැය අවශ්‍ය ප්‍රමාණයට ක්‍රම ක්‍රමයෙන් අවශ්‍ය දියුණුව සඳහා නාස්තිය අවම වන ලෙස සැලසුම් සහිතව ආයෝජනය කිරීම ඵලදායිතාව වර්ධනය වීමට හේතු වේ.

සම්පත් ආයෝජනය ලැබෙන ප්‍රතිලාභ අතර අනුපාතය ඵලදායිතා අනුපාතය ලෙස සැලකෙන අතර රටවල් කිහිපයක ඵලදායිතා අනුපාතය සලකා බලමු.

| රට | ඵලදායිතා අනුපාතය |
|---|---|
| හොංකොං | 41.00 |
| තායිලන්තය | 37.00 |
| චීනය | 36.00 |
| කොරියාව | 34.00 |
| සිංගප්පූරුව | 28.00 |
| ඉන්දියාව | 20.00 |
| පාකිස්තානය | 14.00 |
| ශ්‍රී ලංකාව | 1.40 |

මේ මගින් අපට වටහාගත හැකිවන්නේ ලොව සෙසු රටවල් කෙසේ වුවත් ආසියාතික රටවල් අතුරෙන් පවා ශ්‍රී ලංකාවේ ඵලදායිතා අනුපාතය ඉතා පහත් මට්ටමක පවතින බවයි.

අප විවිධ සාධක පදනම් කරගෙන ඵලදායිතාව නගා සිටුවීමට උත්සුක වීමේදී ඉතාලි ජාතික ආර්ථික විද්‍යාඥයකු වූ 'විල්ෆ්‍රඩෝ පැරටෝ' ගේ අදහස් වැදගත් වේ. ඵලදායිතා ශිල්පීය ක්‍රමයක් ලෙස මේ අදහස් සුවිශේෂී වන අතර ක්‍රි. ව. 1848 සිට ක්‍රි. ව. 1923 ජීවත් වූ විල්ෆ්‍රඩෝ ගේ එම මතය අද්‍යතනයේ පැරටෝ නියමය වශයෙන් හඳුන්වමු.

## පැරටෝ නියමය

අලෙවිකරණය, ප්‍රමිතිකරණය, තොග පාලනය, භාණ්ඩ ඇණවුම් කිරීම හා මිලදී ගැනීම, බෙදා හැරීම අපනයන අවම කර දෝෂ අඩු කිරීම යන සෑම ක්‍රියාවලියකදීම යොදා ගත හැකි ඵලදායිතාව නැංවීමේ ශිල්පීය ක්‍රමය යි.

විල්ෆ්‍රඩෝ පැරටෝ නම් ආර්ථික විද්‍යාඥයා ජීවත් වූ කාලයේ ඉතාලියේ ජනගහනයෙන් 20% ක ප්‍රමාණය කට එරට ධනයෙන් සහ බලයෙන් 80% ක් හිමිවී තිබූ අතර 80% ක ප්‍රමාණයකට ධනය සහ බලය හිමිව තිබුණේ 20% ක් පමණ ය. මේ කරුණු පදනම් කරගෙන මේ පැරටෝ නියමය 80/20 (අසූවේ විස්ස) න්‍යාය ලෙස ද හඳුන්වනු ලැබේ.

පැරටෝ නියමය මගින් නාස්තිය සහ සම්පත් කළමනාකරණය කර ගන්නේ කෙසේදැයි අප මීළඟට සාකච්ඡාවට ගනිමු. මෙහිදී අප නිවසේ හෝ කාර්යාලයේ මුළු මාසික වියදම එකිනෙක අවරෝහණ ක්‍රමයට පෙළගස්වා ක්‍රමයෙන් ඉන් ඉහළ සිට පහළට 20% ක ප්‍රමාණය ගත් විට එය මාසික වියදමින් (මූල්‍ය) 80% ක් වේ. ඉතිරි අයිතම 80% ක ප්‍රමාණය එම මාසයේ අදාළ ආයතනයේ වියදමින් 20% කි. එනම් නාස්තිය සහ අපතය සිදු වන්නේ ඉහළින් දක්වූ 80% ක් වුයදම් වූ 20% ක අයිතමයන්ට වන අතර නාස්තිය අවම වන ආකාරයට එම අංශ සංවිධානය කරගත යුතු වේ.

* මේ තත්ත්වය ක්‍රියාවට නැංවීමේ උපාය මාර්ග වශයෙන් භාවිත කරන මිල අධික භාණ්ඩ හා සේවා වෙනුවට විකල්ප භාණ්ඩ හා සේවා ලබා ගැනීම
* ඒකක මිල අඩුවුත් විශ්වාසනීයවූත් ආයතනයන්ගෙන් සැපයුම් ලබා ගැනීම
* සැලැස්මකට අනුව අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම, අනවශ්‍ය භාණ්ඩ හා සේවාවල වියදම් සලකා බැලීම, ප්‍රමාණවත්ව තොග පවත්වා ගැනීම
* සේව්‍ය සේවක සහයෝගිත්වයෙන් සහ සහභාගිත්වයෙන් ක්‍රමවත්ව කටයුතු කිරීම
* 'A B C' විග්‍රහය ලෙස පැරටෝ නියමය අද්‍යතනයේ භාවිතා වන අතර A B C ලෙස භාණ්ඩවල ධනාත්මක අගය සහ වටිනාකම මත පෙළගස්වා තිබේ. එසේනම් සම්පූර්ණ භාණ්ඩ වටිනාකමින් අඩකටත් වඩා උපයනු ලබන A වර්ගයේ භාණ්ඩය සඳහා මනා ලෙස කළමනාකරණය වූ සැලැස්මක් තිබිය යුතු වේ. ඒ කෙරෙහි විශේෂ අවධානයකින් නිෂ්පාදකයා පසු විය යුතු වේ.

මනා කළමනාකරණය සහ නායකත්ව කුසලතා මෙහිදී අවශ්‍ය ශිල්පීය ක්‍රමය වේ. මෙහිදී සංවිධානාත්මකව තොරතුරු ලබා ගැනීම තුළින් කරුණු

විශ්ලේෂණය කර ආයතනයේ අරමුණ ඉටුකර ගැනීම සඳහා සේවක සහභාගිත්වය ලබා ගැනීමත් නිර්මාණශීලීත්වය අගය කිරීම, ගැටලු සාමූහිකව නිරාකරණය කිරීම සහ වැදගත් කාර්යයන් ක්‍රමානුකූලව වාර්තා තබා ගනිමින් කිරීමත්, වගකීමක් දැරීමට ඇති හැකියාව සහ නායකත්ව චර්යා සහ කුසලතා සංවර්ධනයත් වැදගත් වේ. පැරටෝ ක්‍රමය නොහොත් A B C ක්‍රමය භාණ්ඩ වර්ගීකරණය සහ ප්‍රමුඛතාව අනුව සැලසුම් කරන අතර ඵලදායිතා වර්ධනය තුළින් උසස් ජීවන තත්ත්වයක් ඇතිකර ගත හැකි වේ.

## “එස් පහ” (5S ක්‍රමය)

ඵලදායිතාව පිළිබඳ ලොව බොහෝ රටවල් අවධානය යොමු කරනු ලැබීමත් සමගම මේ පිළිබඳ විවිධ උගතුන් විසින් විවිධ අදියර යටතේ එය ක්‍රියාවට නැංවීමට උත්සුක වූයේ ය. එම ‘එස් පහ’ (5ඉ) ක්‍රමය ජපන් ජාතිකයකු වන මහාචාර්ය අකීමොටෝ ගේ අදහස් අනුව ඵලදායිතාව වර්ධනය කිරීම, ක්‍රියාවට නැංවීම සඳහා ඉදිරිපත් කළ ශිල්පීය ක්‍රමයකි. ගෘහ කළමනාකරණයේ දී වේවා ව්‍යාපාර කළමනාකරණයේදී වේවා මේ 5ඉ ක්‍රමය අනුගමනය කිරීමෙන් සාර්ථකත්වය වෙත පියවර තැබිය හැකි වේ. එමෙන්ම මෙය ඉතා ක්‍රමානුකූලව පියවරෙන් පියවර සිදුවනු ලබන සරල ක්‍රමෝපායක් වශයෙන් හඳුන්වා දිය හැකි ය. මේ යටතේ ඔහු ජපන් වචන 5 කට අර්ථ ගන්වයි. එනම්

1. සෙයිරි
2. සෙයිටෝන්
3. සෙයිසෝ
4. සෙයිකෙත්සු
5. ෂිත්සුකේ යනුවෙනි.

මනා කළමනාකරණයකින් යුතු ඵලදායක නිවසක් වේවා ආයතනයක් වේවා මේ ක්‍රම අනුගමනය කිරීමෙන් දියුණුව කරා ළඟා වන්නේ කෙසේදැයි විග්‍රහ කිරීම මීළඟට වැදගත් වේ.

## සෙයිරි

සෙයිරි යනුවෙන් අදහස් කරනුයේ අවශ්‍ය දේ කුමක් ද? අනවශ්‍ය දේ කුමක්දැයි නිර්ණය කරගෙන අනවශ්‍ය දේ ඉවත්කිරීම වේ. එය සංවිධානාත්මක බවේ මූලිකාංගයක් වන අතර නිවසේ තම පෞද්ගලික දෙයක් නම් තමා විසින් ම ද ආයතනයේ අනවශ්‍ය දෙයක් නම් එම ආයතනයේ වගකිව යුත්තන් (අයිතිකරු) හට ඒ පිළිබඳ දන්වා පිළිතුරු ලබා ගෙන මෙය ක්‍රියාත්මක කළ හැකි ය. උදා : වශයෙන් අප භාවිතා කරන මුදල් පසුම්බිය ගනිමු. මෙහිදී එහි මුදල්වලට අමතරව කොතෙකුත් අනවශ්‍ය දේ තිබිය හැකි ය. අනවශ්‍ය බස් ටිකට්, කොළකෑබලි ආදී ප්‍රයෝජනයක් නොමැති ද්‍රව්‍ය ඉවත් කිරීමෙන් එම පසුම්බිය භාවිත කිරීමේදී අපට අවහිරවීම්වලින් තොරව අදාළ කටයුතු කළ හැකි නොවේ ද?

මේ ආකාරයට සේවා ස්ථානයේත් නිවසේත් සියලු ආයිතමයන් බ්2යාකාරිත්වය ක්ෂය වීම, මිශ්‍ර වීම, කල්ඉකුත් වීම ආදී හේතුකොට ගෙන එය සඳහා සෙයිරි ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි විමසීමේදී එය

* ඉවත දැමීම සඳහා
* විකිණීම සඳහා
* වෙනත් ස්ථානයක ගබඩා කිරීම
* වෙනත් අංශවලට යැවීම වශයෙන් වර්ග කළ හැකි ය.

### ඉවත දැමීම සඳහා

මෙහිදී තමාට හෝ අනෙක් අයහට ප්‍රයෝජනයක් නොමැති භාණ්ඩ හා සේවා ඉවත් කිරීම හෝ විනාශ කිරීම කළ යුතු වේ. එවිට ඉඩකඩ නාස්තිවීම හා අපතේ යාම වැළැකීම මගින් ඵලදායිතා සංවර්ධනයට එය රුකුල් දේ.

### විකණීම සඳහා

තමාට අනවශ්‍ය වූද යම් වටිනාකමක් ඇත්තා වූ ද භාණ්ඩ කිසියම් මිලකට විකුණා දැමීම මගින් ආර්ථික වාසි සහ ඉඩකඩ අපතේ යාමක් නොවීමත් මගින් ඵලදායිතාව සංවර්ධනය වේ. උදා : ජපානයේ අනවශ්‍ය සහ පාවිච්චි කරන ලද භාණ්ඩ මිලදී ගන්නා රටක් ලෙස ශ්‍රී ලංකාව දැක්විය හැකි ය. එරට පාවිච්චි කරන ලද අමතර කොටස් විශාල ලෙස විකුණන රටක් බවට ශ්‍රී ලංකාව පත්ව ඇති අතර එය ලාංකීය ඵලදායිතාව අඩුවීමට හේතු විය හැකි ය.

### වෙනත් ස්ථානයක ගබඩා කිරීම

එදිනෙද භාවිතයට නොගන්නා භාණ්ඩ ගබඩාවන්හි ඉඩකඩ ඇති කිරීම සඳහාත් අවහිර වීම් වැළැක්වීම සඳහාත් වෙනත් ස්ථානයක එය තැන්පත් කිරීමේදී ඉඩකඩ නාස්තිය අවම කරගෙන ඵලදායිතාව වැඩිදියුණු කර ගත හැකි ය.

### වෙනත් ස්ථානවලට (අංශ වලට) යැවීම

එක ස්ථානයක එම භාණ්ඩය හෝ සේවාව ලබා ගෙන අවසන් වී නම් එය අවශ්‍ය ඊළඟ අංශය වෙත යැවීම මගින් අදාළ අංශයට අත්‍යවශ්‍ය නොග ගොඩ ගැසීමත් සිදු නොවන අතර ඉඩකඩ නාස්තිය අවම කරගත හැකි ය.

සෙයිරි ක්‍රියාවට නැගීමේදී ඉක්මන් සහ පහසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමත් මෙන්ම අඩු පිරිවැයක් ඒ සඳහා වැය කිරීමටත් වගබලා ගත යුතු වේ. ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල සෙයිරි ක්‍රියාත්මක වීම සිදු නොවන අතර එයට හේතුව වන්නේ එක්රැස් කිරීමේ මානසික මට්ටමින් පෙළෙන අය බහුතරයක් සිටීම වේ. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 12.5% ක් මානසික රෝගීන් වන අතර ඔවුනතුරින් බහුතරයක් එක්රැස් කිරීමේ මානසිකත්වයෙන් පෙළෙන බැව් වාර්තා වේ. මේ තත්ත්වය අවම කර ගැනීම මගින් ඵලදායිතාව වර්ධනය කරා ළඟා වීමට හැකි ය.

## සෙයිටෝන්

අවශ්‍ය දේ පහසුවෙන් ගැනීම සඳහා සුදුසු ස්ථානයක පිළිවෙළකට තැබීම සෙයිටෝන් වේ.

භාණ්ඩ හා සේවා නිසියාකාරව ගබඩා නොකිරීම මගින් කාලය නාස්ති වීම ඵලදායිතා සංවර්ධනයට බාධාවකි. උදා : වශයෙන් නිවෙසක් ගතහොත් එහි කරන කාර්යයට වඩා වැඩි කාලයක් යන්නේ එම භාණ්ඩ සෙවීමට ය. අප ඇඳුම් අඳිනවාට වඩා එම ඇඳුම් සෙවීමට අපට කාලය නාස්ති වේ. එනම් ඵලදායිතාවට එය බාධාවකි. සෙයිටෝන් ක්‍රියාත්මක කිරීමෙන් සෙවීමේ කාලය අවම කර ගත හැකි වේ.

මෙහිදී අවශ්‍යතාව අනුව එය තැබිය යුතු ස්ථානය තීරණය කළ යුතු වේ. නිතර අවශ්‍ය වන ද්‍රව්‍ය ආසන්නයෙනුත් කලාතුරකින් අවශ්‍ය වන ද්‍රව්‍ය ඈතිනුත් ගබඩා කළ හැකිය. සෙයිටෝන් ක්‍රියාත්මක කිරීමේදී සෙවීමේ කාලය අවම කර ගැනීම සඳහා පහසු ශිල්ප ක්‍රම භාවිතා කළ හැකි වේ.

## ලේබල් කිරීම

නිවෙසක හෝ කාර්යාලයක හෝ අදාළ භාණ්ඩයට ලේබලයක් ඇලවීමෙන් එය පහසුවෙන් සොයා ගත හැකි වේ. උදා : මුළුතැන්ගේ ඇති තුන පහ මිරිස් ආදිය බෝතලවලට දමා ඒවායේ අදාළ ලේබල ඇලවීමෙන් අදාළ කාර්ට පහසු වේ.

## දර්ශන පථ පාලනය කිරීම

අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව තමා කරන කාර්ය පහසු කිරීම සඳහා දර්ශන පථ පාලනය කිරීම වැදගත් වේ. උදා: කර්මාන්තශාලාවක යන්ත්‍ර සූත්‍ර තැබිය යුත්තේ ද්‍රව්‍ය හා වැඩ ඇන නොහිටින ආකාරයෙන් සහ සේවක අනවශ්‍ය චලනය ඇති නොවන පරිදි ය. මේ ආකාරයට කාර්යාලයකදී කළමණාකරු ගේ කාමරය තිබිය යුත්තේ මුළු කර්මාන්තශාලාව ම දර්ශනය වන අයුරිනි. ආපන ශාලාව පහසුවෙන් ළඟා විය හැකි තැනක තිබිය යුතු ය. මේ ආකාරයට ගොඩනැගිලි සැලසුම්, ගබඩා කිරීම් ආදී දේ ක්‍රමානුකූලව කිරීම මගින් සේවකයන්ගේ පෙනුම හා හැසිරීමෙන් සෙවීමේ කාලය අවම කිරීමට එම දර්ශන පථ පාලනය කිරීමෙන් හැකි වන බව මනාව පැහැදිලි වේ.

## ලකුණු කිරීම

භාණ්ඩ වර්ගීකරණය අනුව සංකේත මගින් ලකුණු කිරීම නිසා ඒ ඒ භාණ්ඩ සොයා ගැනීමේ කාලය අවම කරගත හැකි වේ.

උදා : රිය නවත්වන ස්ථානය, පුස්තකාලය තුළ පොත් තබා ඇති පිළිවෙළ ආදිය දැක්විය හැකි ය.

## වර්ණ පද්ධති භාවිතය

වර්ණ භාවිත කිරීම මගින්ද සෙයිරි ක්‍රියාත්මක කිරීම ඵලදායක කරගත හැකි ය. උදා : ගබඩා දෙරවල් කොළපාටින් ද, කර්මාන්තශාලා වැසිකිළි දෙරවල් ගුරු පාටින් ද ආදී වශයෙන් මෙය භාවිතයට ගත හැකි වේ. එමෙන් ම සේවකයන්ට අහිතකර ශබ්ද තරංග ඇති ස්ථානය රතු වර්ණ ගැන්වීම ආදිය මේ සඳහා තවත් උදාහරණයකි. මේ අංග මනාව ක්‍රියාත්මක කිරීම මගින් සංවිධිතභාවය කාර්යක්ෂමතාව ඇති කරයි.

## අංක යෙදීම

නිසියාකාර අංක යෙදීම මගින් උපකරණය හෝ භාණ්ඩය කඩිනමින් සොයා ගත හැකි වේ. උදා : රෝහලක ඇඳන් අංක මගින් දැක්වීම, හෝටලයක කාමර අංක මගින් පෙන්වීම ආදිය වේ.

මේ ආකාරයට සෙයිටෝන් ක්‍රියාවට නැඟීම මගින් ක්‍රමානුකූල රටාවකට සේව්‍ය, සේවක දෙපක්ෂයම හැඩගැසෙන අතර අභෞතික වශයෙන් මානසික සහනයටත් භෞතික වශයෙන් ඵලදායීතාවටත් ඉවහල් වේ.

## 3. සෙයිසෝ

ගෘහයක දී වේවා කර්මාන්තශාලාවක දී වේවා ක්‍රමානුකූලත්වය සඳහා අඛණ්ඩ පිරිසුදු කිරීම සිදු විය යුතු ය. ඒ මගින් යන්ත්‍ර සූත්‍රවල දෝෂ පවා සොයා ගත හැකි ය. දිනපතා ම තමා නිසියාකාරව භාණ්ඩ පිරිසුදු කරනවා නම් එම භාණ්ඩවල දිගුකල් පැවැත්ම ද සිදු වේ. එමෙන් ම පිරිසුදු කිරීමට කණ්ඩායමක් සිටිනවා යන මානසිකත්වයෙන් මිදීම මෙහි දී වැදගත් වේ. නිසි පිරිසුදු කිරීමේ ක්‍රියාවලියේදී පිරිසුදු කිරීම් සඳහා මෙවලම් භාවිතය වැදගත් වේ. මෙහිදී අනවශ්‍ය වෙහෙස අඩුවීම, නිසි පිරිසුදු කිරීම් මගින් භාණ්ඩවල දිගුකල් පැවැත්ම ආදිය සිදුවන වාසි අතර වේ. එමෙන් ම කාර්යාලයකදී වුව සේවකයා කම්කරුවෙකු වුවද ඔහු ඒ තත්ත්වයේ සිටීම පහත් කොට නොසලකා ඔහුත් එම ආයතනයේ දියුණුවට උරදෙන්නෙකු සේ සලකා ඇඳුම් පැළඳුම් පවා අන්‍යන්ගෙන් වෙනස් නොවන ආකාරයට සකස්කර මනා ලෙස ඔහුගේ මානසිකත්වය පවා සකස් කිරීමට සේව්‍යයා වග බලා ගත යුතු වේ.

එමෙන්ම නිසි ලෙස පිරිසුදු කිරීමේ දී ඒ ඒ අවශ්‍යතාවට ගැලපෙන ආකාරයෙන් කුණු දැමීම සඳහා භාජන භාවිතා කිරීමෙන් ඒවා පහසුවෙන් ඉවත් කිරීමට හැකියාව ලැබේ. උදා : ලියන මේසය ළඟ කුණු දැමීමට කූඩයක් ආදී වශයෙනි. එමෙන්ම නිසියාකාර අපද්‍රව්‍ය බැහැර කිරීම මගින් ඒවායින් අතුරු ප්‍රයෝජනත් සෞඛ්‍යත් රැක ගැනීමට හැකි වේ. එමෙන් ම අනුපිළිවෙළට පිරිසිදු කිරීම් මගින් ඇතැම් ස්ථාන මගහැරීමට ඇති ඉඩකඩ ඇහිරී මනා පිරිසුදු කිරීමක් සිදු වේ.

ආයතනයකදී මේ නිසි පිරිසුදු කිරීම් හිතා මතා ඇතැමුන් පැහැර හරිය අවස්ථා දැකිය හැකි අතර තමා කළ කාර්යය දැක්වීමට සටහන් හා ලේබන පවත්වාගෙන යාම ප්‍රයෝජනවත් වේ. මේ ආකාරයට යන්ත්‍ර සූත්‍ර සහ අවට පරිසරය පිරිසුදු කිරීමෙන් ජීවිතවලත් යන්ත්‍ර සූත්‍රවලත් ආයතනයේත් දිගුකාලීන පැවැත්මක් බලාපොරොත්තු විය හැකි ය. සෙයිසෝ ක්‍රියාත්මක කිරීමේදී බාහිර පාරිශුද්ධිය පමණක් නොව අභ්‍යන්තර (මානසික) පාරිශුද්ධියත් වැදගත් වන අතර ආගම දහම වෙත සබැඳි කල්පනාවන් ඇති කිරීමට උත්සුක වීම මගින් එය ළඟා කර ගත හැකි ය. එමගින් ඵලදායී සේවකයන් සඳහා පිරිසුදු හා ඉහළ මානසික මට්ටමක් ඇතිකර ගත හැකි වේ.

## 4. සෙයිකෙත්සු

නිවෙස හෝ සේවා ස්ථානයේ ක්‍රමවත් බවක් සැම විටම පවත්වාගෙන යාම මෙයින් අදහස් කෙරේ.

ඉහත දැක්වූ සෙයිරි, සෙයිටොන්, සෙයිසෝ යන ක්‍රම අඛණ්ඩව පවත්වාගෙන යාම මගින් සෙයිකෙත්සු කරා ළඟා විය හැකි අතර ප්‍රමිතිය හා සම්මතකරණය මින් අපේක්ෂා කෙරේ. සෙයිකෙත්සු කෙරෙහි ආයතනයක් යොමු කිරීම සඳහා තරග පැවැත්වීම, ත්‍යාග ප්‍රදානය ආදිය සිදු කිරීම ප්‍රයෝජනවත් කාර්යයකි.

එයින් සෙයිකෙත්සු ක්‍රියාවට නැඟීමට ඔවුන් දිරිමත් වේ. මේ සඳහා පුද්ගල ආකල්ප වර්ධනයක් ද අපේක්ෂිත වන අතර ඉන් හොඳ මානසික මට්ටමක් ඇති ඵලදායී පුද්ගලයෝ බිහි වෙති.

## ෂිත්සුකේ

මින් අදහස් කෙරෙන්නේ මනා ගෘහ / ආයතන පාලනය පිළිබඳ විවිධ නීති නිදහසේ අනුගමනය කිරීමට ජනතාව පුහුණු කිරීම වේ.

මෙහිදී විශාල වගකීමක් පැවරෙන්නේ ආයතන කළමනාකාරිත්වයට වන අතර මනා ලෙස සංවිධිත වූ පාලනයෙන් සියලු කාර්ය මණ්ඩලය පුහුණු කරවා සමාගම තුළ යහපත් සංස්කෘතියකට හුරු කිරීම මගින් එය සැම දෙනාටම හුරු පුරුදු කාර්යක් වනු ඇත.

එමෙන් ම නායකත්වය යන හැඟීම සේවකයාට ද පවරා ඔහු මේ සඳහා ක්‍රමවත්ව දායක කරගත හැකි වේ. එමෙන්ම ආයතන ප්‍රධානියා ඉහත සඳහන් ඵලදායීතා ක්‍රම ක්‍රියාවට නැංවීමට උත්සුක විය යුතු අතර වේලාවට වාර්තා කිරීම, ක්‍රමවත්ව ක්‍රියා කිරීම, ආදර්ශවත්ව හැසිරීම ආදී ස්වයං පාලනයක් ඇති කර ගත යුතු ය.

මෙයට අමතරව අදාළ ස්ථානයේ ප්‍රසන්න බව රඳවා ගැනීමත් වැදගත් වේ. මේ සඳහා උදා : වශයෙන් මල්බඳුනක් තැබීම, අලංකාර දැන්වීම් භාවිතය ආදිය දැක්විය හැකි ය.

සමස්ථයක් වශයෙන් ගත් කළ මේ (5ඉ) එස් පහ ක්‍රියාවලිය තුළ ත්‍රිත්ව පැතිකඩක් දැකිය හැකි ය. එනම්

1. සෙයිරි, සෙයිටෝන්, සෙයිසෝ, සෙයිකෙත්සු, ෂිත්සුකේ යන ක්‍රියාවලි පහ මනා ලෙස අවබෝධ කරගෙන ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කිරීමේ පැතිකඩ වේ.

2. මේ ක්‍රියාවලි 5 අඛණ්ඩව ක්‍රියාවේ යෙදීමට ආශා කිරීම සහ පුරුද්දක් කර ගැනීම, ඇබ්බැහි වීමේ පැතිකඩ නම් වේ.

3. සේවා ස්ථානයේ අතිරික්ත ගබඩා කිරීම් ඒකරාශි වීම් වැළැක්වීමේ ක්‍රම විමර්ශනය කිරීම, කුණු කන්දල් ඇතුළුවීම වැළැක්වීම, අධිකාරි බලය එක්රැස් වීම ආදිය වැළැක්වීමේ පැතිකඩ නම් වේ.

මේ ආකාරයට මනා සංවිධිත වූ අයුරින් 5ඉ ක්‍රියාවට නැඟීම මගින් ඉන් ලැබෙන ඵල ප්‍රයෝජනයන් ද අති මහත් ය.

* කාර්යක්ෂමතාව වර්ධනය වීම
* නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවේ ගුණාත්මක භාවය මින් අදහස් වේ.
* අනතුරු අඩුවීම
* යන්ත්‍ර සූත්‍ර ක්‍රියා විරහිත වීම අවම වීම
* ආතතිය අඩු වීම - සියලුම සේවකයින් එකම ක්‍රමයක් පැවැත්මක් අනුගමනය කිරීමෙන් උසස් මානසික සංතෘෂ්ටියක් ලබා ගත හැකි වීම සහ තමා ගැන ඇතිවන නිහතමානී සාඩම්බර බව සිදු වේ.
* සේවා තත්ත්වය වර්ධනය වීම - වැටුප් හා සේවා උසස්වීම් ලැබීම
* පාරිභෝගික සේවා වර්ධනය වීම් - ගුණාත්මක භාණ්ඩ හා සේවා නිසාත් සේවකයනට වඩාත් යහපත් ජීවන තත්ත්වයක් ඇති නිසාත් භාණ්ඩ හා සේවාවලට වැඩි ඉල්ලුමක් ඇති වේ.
* එක්සත් බව නිරූපණය වීම - සේව්‍ය සේවක දෙපක්ෂයේ ම සහභාගිත්වයෙන් ආයතනයේ කටයුතු සිදු කිරීම නිසා එක්සත් බවක් ඉන් ප්‍රකට වේ.

මේ ආකාරයට ඉතා සරල ක්‍රියා මාර්ගයන්ගෙන් සැදුම්ලත් ඵලදායීතා ශිල්පීය ක්‍රම අනුගමනය කිරීමෙන් සැබවින් ම ශ්‍රී ලාංකීයයන් වන අප, අපහටත්, රටටත්, ලොවටත් ඵලදායී පුද්ගලයන් වීමට අදිටන් කර ගනිමු. ❑